සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/3/ACC/14/ Dele-2016

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2016.12.14

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරින්

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියළුම මහ සංගම් කළමනාකරුවන්

මූලස්ථාන කළමනාකරුවන් සහ සියළුම ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කළමනාකරුවන්

**ගිණුම් උපදෙස් හා මූල්‍ය පාලනය පිළිබඳ බලතල පැවරීම - 2016**

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂයේ ගිණුම් උපදෙස් හා මූල්‍ය පාලනය පිළිබඳ බලතල පැවරීම සම්බන්ධව 2016.02.18 දින නිකුත් කරන ලද දිවිනැගුම ගිණුම් චක්‍රලේඛ අංක 01/2016 දරණ ලිපිය හා එයට පසුව සිදු කරනු ලැබූ සංශෝධන වලට අතිරේක වශයෙනි.

02. එම චක්‍රලේඛයේ 08 වන ඡේදය මගින් දක්වා ඇති අතිකාල, නිවාඩු දින වැටුප්, ගමන් වියදම් සහ අමතර රාජකාරි සඳහා දීමනා ගෙවීම සම්බන්ධව නිකුත්කර ඇති එක් එක් නිලධාරි කාණ්ඩයේ මාසික ගමන් වියදම් දීමනා සහ එම ගමන් වියදම් දීමනා ගෙවිය යුතු මූල්‍ය ප්‍රභවය පිළිබඳව මාගේ සමාංක හා 2016.09.06 දිනැති ලිපිය මගින් උපදෙස් ලබාදී ඇත. එම ලිපියේ සඳහන් නිලධාරි කාණ්ඩයට අමතරව පහත සඳහන් නිලධාරින් සඳහාද මාසික උපරිම ගමන් වියදම් දීමනාවක් ඉදිරියෙන් දක්වා ඇති මූල්‍ය ප්‍රභවය යටතේ ගෙවීම සහ වසම්භාර දිවිනැගුම සංවර්ධන නිලධාරින් සඳහා ගෙවිය යුතු රු. 750/- ක මාසික දීමනාව 2016 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා පමණක් බැංකු අරමුදලින් ගෙවීමද අනුමත කරමි.

| නිලධාරියාගේ තනතුර | මාසික දීමනාව රු. | වියදම් දැරිය යුතු මූල්‍ය ප්‍රභවය |
|---|---|---|
| දිවිනැගුම කළමනාකරු (ව්‍යාපෘති) | 3,000/- | වාර්ෂික ඇස්තමේන්තු මුදලින් |
| වසම්භාර දිවිනැගුම සංවර්ධන නිලධාරින් | 750/- | බැංකු අරමුදලින් 2016 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා, 2016 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වාර්ෂික ඇස්තමේන්තු මුදලින් |

Tel- Fax - E-mail-

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
011-2873802/2872202
011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
மேலதிக பணிப்பாளர்தலைமையதிபதி
Additional Director General
011-2871672
011-2887280
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ )පාලන(
பணிப்பாளர் (நிர்வாகம்)
Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
011-2887280
**011- 2887722**(Hotline)

03. උක්ත චක්‍රලේඛයට වැඩිමනත් වශයෙන් බැංකු අරමුදලින් ගෙවිය යුතු ගමන් වියදම් දීමනා ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳව අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය විසින් නිකුත් කරන ලද අංක DDD/HO/MF/02/05/08/ චක්‍රලේඛ හා 2016.09.21 දිනැති උපදෙස් මාලාව අනුව දිවිනැගුම බැංකු කළමනාකරුවන් විසින් ඔවුන්ට අදාල ගමන් වියදම් එම බැංකුවෙන් ලබාගත යුතු අතර බැංකු අරමුදලෙන් ගමන් වියදම් දීමනාව ගෙවනු ලබන අනෙකුත් සියලුම නිලධාරින් සඳහා මාසිකව ගෙවිය යුතු සත්‍ය ගමන් වියදම් වටිනාකම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරු විසින් ප්‍රධාන ගණකාධිකාරි වෙත දන්වා මුදල් ලබාගැනීමෙන් අනතුරුව ගෙවීම් කළ යුතුය.

04. මූල්‍ය බලතල පැවරීමේ චක්‍රලේඛයේ 08 වන ඡේදය මගින් දක්වා ඇති අනෙකුත් උපදෙස් කිසිදු වෙනස් කිරීමක් නොමැතිව ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කළයුතු බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

**නීල් හපුහින්න**

**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම් - මුදල් අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| 02. | ලේකම් - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| 03. | ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| 04. | ලේකම් - සමාජ සවිබලගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| 05. | විගණකාධිපති | - | කා.දැ.පි. |
| 06. | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | - | කා.දැ.පි. සහ අදාල මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා |